# Living the Lotus

## Buddhism in Everyday Life

4
2025
VOL. 235






Living the Lotus
Vol. 235 (April 2025)

Senior Editor: Keiichi Akagawa
Editor: Sachi Mikawa
Copy Editors: Ruklanthi Palipana, Rajitha Maduranga

published by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124 FAX: +81-3-5341-1224
mail: living.the.lotus.rk-international@kosei-kai.or.jp

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මුලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමි ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදි නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මුලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life（සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙදා දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.）යන තේමාව තුල, එදිනෙදා ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවු ලස්සන නෙලුම් මලක් සේ තම ජිවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවු සාමාජික සාමාජිකාවන් එදිනෙදා දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවු අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදාහැරීම සිදු කරනු ලැබේ.

*President's Message*



# විශ්වාසයෙන් යුතුව ඇදහීම යනු

නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

## 'ශ්‍රද්ධාව' යනු

ශාඛ්‍යමුණි උපත ලැබූ දිනය, බෞද්ධ දර්ශනය අදහන අපිට ඉතා වැදගත් දිනයක් වේ. ජපානයේ නම් අප්‍රේල් 8 වන දින ශාඛ්‍යමුණි බුදුන් වහන්සේගේ උපත සැමරීම සඳහා පූජා පවත්වනු ලැබේ.

සුමියෝ මොරි මහතාගේ කවි පදයක, 'උපත ලැබූ දිනයේ මමද ඉතා කුඩාය - බුෂ්ෂෝ එ' ලෙසින් සදහන් වේ. ජපානයේ ශාක්‍යමුනි බුදුන්ගේ උපත බුෂ්ෂෝ එ(බුද්ධ උපත), කන්බුත්සු කයි (තේ පැන් වලින් නැහැවීමේ උත්සවය), හනා මත්සුරි (මලින් පිරී ගිය උත්සවය) ආදී නොයෙකුත් නම් වලින් හඳුන්වයි. එක් දිනක ශාඛ්‍යමුණි බුදුන්ගේ උපත සමරන අවස්ථාවක, කුඩා සිදුහත් කුමරුගේ පිළිරුව ජපන් සම්ප්‍රදායට අනුකූලව තේ පැන් වලින් නහවන විට, තමාගේ උපන් අවස්ථාව සිහිවී, මටත් සිදුහත් කුමරු හා සමාන වටිනා ජීවයක් ලැබී තිබෙන බව වැටහුනා යැයි සදහන් සුමියෝ මොරි මහතා කරයි.

ශාඛ්‍යමුණිගේ උපතේදී පැවසූ 'මම ලොවට අග්‍ර වෙමි. මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි. මම ලොවට ජ්‍යේෂ්ඨ වෙමි' යන්න, 'මනුෂ්‍යයෙකු ලෙස උපත ලැබීමේ අගය අවබෝධ කරගෙන, කෘතවේදී වීම තුලින්', ඇතිවන ආරක්ෂිත හැඟීමත් සමඟින් 'බුදුන් වහන්සේගේ' හදවත සහ තම හදවත එකට යාවී තිබෙන' හැඟීමට පත්වීම 'ශ්‍රද්ධාව' ලෙසින් නිර්මාතෘ තුමා විසින් සදහන් කරයි. එමනිසා, ශාඛ්‍යමුණිගේ උපත සැමරීම පාදක කරගෙනවිශාල පිරිසක් තමන් හා අන්‍යයන්ගේ ජීවිතයේ වටිනාකම අවබෝධ කරගෙන, එයට කෘතවේදී වීම සැබැවින්ම අපූරු සහගතය.

'නියම මනුෂ්‍යයෙකු ලෙස ජීවත්වන ආකාරය කියාදෙන්නේ ශ්‍රද්ධාව තුලින්' ලෙසයි නිර්මාතෘ තුමා විසින් ප්‍රකාශ කර ඇත්තේ. මන්ද, මනුෂ්‍යන්ගේ එදිනෙද ජීවිතය, ආධ්‍යාත්මය හා ජීවන රටාව පදනම කියාදෙන්නේ ආගම්, එනම් ශ්‍රද්ධාව තුලිනි. එම මූලිකම කරුණ තුලින් 'තම ජීවිතයේ වටිනාකම, මනුෂ්‍යයෙකු ලෙස ජීවිතය ලැබීමේ කෘතවේදීත්වය දැනගැනීම' යැයි සිතමි.

තවද, ශාඛ්‍යමුණිගේ උපතින් දින 7කට පසු උන්වහන්සේගේ මෑණියන් වන මහමායා දේවිය කලුරිය කලාය. එයින් සංකේතවත් වන්නේ ඉපදීම, වයසට යාම, ලෙඩරෝග සහ මරණය ආදී මේ ලෝකයේ අනිත්‍ය හා අනාත්ම බවයි. සත්‍යය කෙරෙහි අවදානය යොමු කිරීමෙන් දේවල් ඇති ආකාරයටම පිළිගෙන අන් අය සමඟ සමගියෙන් ජීවත් වීම 'සැබෑ මිනිස් ජීවන රටාව' වේ.

වෙනත් ලෙසකට පැවසුවහොත්, 'ශ්‍රද්ධාව' යනු අපගේ ජීවන රටාව දෙවියන් හා බුදුන්ගේ ධර්මය තුලින් ඉගෙන ගෙන, තමාව වර්ධනය කරන්නාවූ මාර්ගෝපදේශයන් ලෙස විශ්වාසයෙන් ඇදහීම වේ. එය වඩාත් නිර්මාණාත්මකව අපගේ එදිනෙද බෝධිසත්ව චර්යයාව තුලින් ප්‍රයෝගිකව ක්‍රියාවට නැංවීමට හැකිවේ.

## කාලයේ වෙනස්කම්වලින් ව්‍යාකූල නොවන්න.

මෑත වසරවලදී සමාජ ගැටලුවක් බවට පත්ව ඇති 'නීති විරෝධී රැකියා' සම්බන්ධයෙන්, එක් ශ්‍රද්ධාවන්ත පුද්ගලයෙක් තම දියණියගෙන් 'තරුණයින් මංකොල්ලකෑම් හෝ මිනීමැරුම් කිරීමට පෙළඹෙන්නේ ඇයි' ලෙස විමසූ විට, දියණිය ඉතා ක්ෂණිකයෙන් 'ඒ ඔවුන්ට ආගමක් නොමැති නිසා' යැයි පවසා තිබෙනවා.

අපගේ හා අන් අයගේ ජීවිත වල වටිනාකම සහ කිසිවෙකුට තනිව ජීවත්විය නොහැකි බව 'ශ්‍රද්ධාව' තුලින් අවබෝධවේ. එවිට අන් අය ගැන සිතීම හා අන් අයට උපකාර කළ යුතුය හැඟීම තිබෙන නිසා ඒ ආකාරයේ නිතී විරෝධී වැඩ අනිවාර්යයෙන්ම නොකරනවාසේම, අන් අයට කාරුණික විය යුතුයි යන ශක්තිමත් ජීවන රටාවකට හුරුවේ. ඒ බව 'ශ්‍රද්ධාවන්ත පවුල් පසුබිම තෝතැන්නක්' කරගෙන හැදී වැඩුනු එම දියණියගේ වචන වලින් පැහැදිලි වේ.

කෙසේ වුවද, මෙයින් ආගමක් අදහන පුද්ගලයන් කිසිවිටකත් නරක දේවල් නොකරන බවත්, ආගමක් අදහන නිසා දරිද්‍රතාවයෙන් සහ අසනීපයන්ගෙන් මිදෙනු ඇත යන්න අදහස් නොවේ. අපට සැබෑ ජීවන රටාව උගන්වන වටිනා ඉගැන්වීම් වන ආගම විශ්වාසයෙන් යුතුව ඇදහීමෙන් අපට බොහෝ දේ ඉගෙන ගත හැකි අතරම, එයින් යහපත් මනුෂ්‍යයෙකු ලෙස අපවම දියුණු කර ගැනීම ඉලක්ක කර ගත හැකි බව අර්ථ ගැන්වේ.

වර්තමානයේ වඩා විවිධත්වයකින් යුතු සංකීර්ණ සමාජය තුල ආගම් හා නොයෙකුත් ඇදහීම පිළිබඳ මහජනතාවගේ දෘෂ්ටිය දැඩි බව පැවසේ. නමුත්, සෑම කෙනෙකුම හද පත්ලෙන් ජීවිතයට සහනයක් දෙන විශ්වාස කල හැකි ඉගැන්වීම් දැන ගැනීමට, ඉගෙන ගැනීමට සහ ඒ තුලින් වර්ධනය වීමට ආශාවක් පවතිනවා. එමනිසාම සියලුම පුද්ගලයන් දැනටමත් ආගම්වල 'ශ්‍රද්ධාවන්තයින්' බව මම විශ්වාස කරමි.

ඒ අනුව, මේ මොහොතේ වැදගත් වන්නේ මතුපිටින් පෙනෙන තාවකාලික පියවරයන් නොව, බුදුදහමේ පදනම වන පූර්ණ කරුණාවෙන් සහ දයාවෙන් යුතුව පුද්ගලයන් සමඟ කටයුතු කරමින් සහ අවශ්‍ය අවස්ථා වලදී සිතට සහනයක් ලබාදිය හැකි පුද්ගලයන් බවට පත් වීමයි. එහි විස්තර කල නොහැකි ආරක්ෂාකාරී හැඟීමක් දැනෙනවා සේම, සහජයෙන්ම ශ්‍රද්ධාවන්ත හදවතක් ඇති ඕනෑම අයෙකුව ක්ෂණිකයෙන් 'සැබෑ ජීවන රටාවක් ගත කිරීමට' යොමුවනු ඇත.

'කෝසෙයි' අප්‍රේල් කලාපය ඇසුරිණි



# මගේම දුක් කම්කටොළු පාදක කරගෙන, අන් අයව දුකින් මුදවා ගැනීමට උපරිම ශක්තිය යොදනවා

## ෂවුන් රිචඩ් මහතා, හවායි ධර්ම ශාඛාව

කුමන කාල වකවානුවක කුමක් හේතු කොටගෙන රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ වූවාද?

2017 අවුරුද්දේ ජනවාරි මස, මගේ වයස අවුරුදු 47 වන විට, මගේ රැකියා ස්ථානයේ මිතුරකු වූ හවායි ධර්ම ශඛාවේ ධර්ම නායකයෙකු වශයෙන් කටයුතු කල කරෙන් ෆුජි සාන් මට රිෂ්ෂො කෝසෙයි කායි සංවිධානය ගැන හඳුන්වා දුන් අතර, එම මග පෙන්වීමට අනුව මම රිෂ්ෂෝ කෝසෙයි කායි සාමාජිකත්වය ලබාගත්තා. මම උසස්පෙළ විභාගය අවසන් කිරීමට වසර කිහිපයකට පෙර මත්පැන් වලට ඇබ්බැහි වූ අතර, විශ්වවිද්‍යාලයට ඇතුල් වුවත් බීමත්කම නිසා ඉන් ඉවත් වන්නට සිදු වූවා. පසුව බීමත්කම එන්න එන්නම වැඩිවූ නිසාවෙන් කිහිපවතාවක්ම රැකියාව වෙනස් කිරීමට සිදු වූවා. 2007 අවුරුද්දේදී මම මද්‍යසාර නිසාවෙන් හෙපටයිටීස් රෝගයට ගොදුරු වී ඇතැයි  මගේ වෛද්‍යවරයා විසින් පැවසූ අතර, තවදුරටත් මත්පැන් පානය කලහොත් සිරෝසිස් තත්වයට පැමිණෙන බවට අනතුරු ඇඟවූවා. කෙසේ වෙතත් මම නැවතත් මත්පැන් පානය දිගටම සිදු කලා

කෙසේ වෙතත්, බුදු දහමට ලැදි වූ මම රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ වීමෙන් පසු, මත්පැන් වලට ඇබ්බැහි වී සිටි මම ඉන් මිදීමට, හවායි ධර්ම ශාඛාවෙන් බුදුදහම, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර ය ගැන ඉගෙන ගනිමින්, ධර්ම ශාඛාවේ ක්‍රියාකාරකම් වලට ක්‍රියාකාරීව සම්බන්ධ වෙමින් වැඩසටහන් වලට උදවු කරමින් කටයුතු කිරීමට පුරුදු වූවා. පසුව විවිධ ආගමික වැඩසටහන් සහ ධර්ම ශඛාවේ ක්‍රියාකාරකම් සඳහා අන් අයට උදවු කිරීමට හැකිවීම ගැන මහත් සතුටක් දැනුණු අතර, ධර්ම මිතුරකු වීමද මට මහත් ප්‍රීතියක් ගෙන ආවා. එවැනි මොහොතකදී මට මත්පැන් නොමැති ජීවිතයක් පටන් ගැනීමට හැකි වූවා.

කෙසේ වෙතත්, දැනට මත්පැන් පානය නවතා දැමුවත් නැවතත් එයට පුරුදුවී පරණ තත්වයටම වැටේවී යන බිය මට තිබුණා. මත්පැන් පානය නතරකර ටික කලක් ගිය පසු නැවත 2018 අවුරුද්දේ අප්‍රේල් මාසයේ දිනක මම මත්පැන් පානය ආරම්භ කලා. අවසානයේ රාජකාරී කාලය තුලත් මත්පැන් පානය කරන තත්වයකට පත් වූවා. කෙසේ නමුත්, ධර්ම ශාඛාවේ කියෝකයිචෝ ලෝරා මේයා සාන්ගේ සහ අනෙකුත් ධර්ම මිතුරන්ගේ සහයෝගය සහ දිරි ගැන්වීම මත, මම මත්පැන් වලින් මිදීම සඳහා උපකාර කරන පුනරුත්තාපන කණ්ඩායමකට සහභාගී වූවා. එහිදී ස්වයං උපකාරක රැස්වීම් පවත්වා අපගේ අත්දැකීම් බෙදගත් අතර නැවත යතාතත්වයට පත් වීම වෙනුවෙන් ක්‍රියාකාරකම් 12ක් පුහුණු කලා. එම අවුරුද්දේම දෙසැම්බර් මාසයේදී අවුරුදු 30ක් මත්පැන් පානයට ඇබ්බැහි වී සිටි මට ඉන් මිදීමට හැකි වූවා.

ඊට පසු, ඔබ වගේම දුකට පත් වූවන් සමග කටයුතු කර උපකාර කලා යැයි අපිට අසන්න ලැබුණා.

දිනක් කියෝක්යිචෝ මේයා, ‘මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී සිටින ක්‍රිස් නම් අයෙකුට උපකාර කරන ලෙස’ පවසා සිටියා. මාතුල වූ ඇබ්බැහිවීමේ දුක් වේදනාව 'නවතා දැමීමට අවශය වුවත් එය කල නොහැකි වීම’ ගැන එහි දුශ්කරබව මම අත්දැකීමෙන් දැන සිටියා. එනිසා මම අනුකම්පාවෙන් යුතුව ක්‍රිස්ට සහාය ලබා දුන්නා සහ මට ඔහු වෙනුවෙන් සිටීමට අවශය වූවා. ඊට පසුව අපි කිහිප වතාවක්ම ධර්ම ශාඛාවේදී ක්‍රිස්ව මුණගැසී ඔහුගේ කතාවට සාවධානයෙන් සවන් දුන්නා. මත්පැන් පිළිබඳ මගේ අත්දැකීම් අවංකවම ඔහුට පැවසූවා. මම ක්‍රිස්ට සුවය පතා සූත්‍ර සජ්ජායනය කල අතර, ඔහුට හුදකලා බවක් දැනෙන ඕනෑම වෙලාවක, දවසේ පැය 24 පුරාම, රාත්‍රියේ, මධ්‍යම රාත්‍රියේ සහ උදේ පාන්දර වුවද මට කතාකල හැකි බව මම පවසා සිටියා. කුමක් සිදු වුවත් මම



ෂවුන් රිචඩ් මහතා

ඔහුත් සමග සිටින බව මම ඔහුට සිත තුල මනසේ සාමය ඇති කලා.

තවත් එක් අවස්ථාවකදී, මම ක්‍රිස් සමග මද්‍යව්‍ය වලට ඇබ්බැහි වූවන් පුරුත්ථපනය කරන කදවුරකට සහභාගී වුනා. ක්‍රිස්ගේ චර්‍යාවන් දෙස බලන විට මගේ අතීතය දෙස බලනවාක් මෙන් හැගුණා. ක්‍රිස්ව හමුවීමෙන් මම මගේ දෙමාපියන් ඇතුලුව විශාල පිරිසකට දුක් කරදර ඇති කල ආකාරය ගැන වැටහුණා. 'අපගේ වර්ධනයට පාදක වන්නේ දුකමයි' ලෙස ඉගෙන ගත් අතර, රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ඉගැන්වීම් වලට ස්තූති වන්නට මතට ඇබ්බැහි වීමේ දුක්කිත අත්දැකීම් තුලින් තවත් මිනිසුන්ගේ ජීවිත දුකින් මුදවා ගැනීමට හැකි බව මම ටිකෙන් ටික වටහා ගත්තා.

මේ වන විට, ධර්ම පුහුණුවේ යෙදෙන්නේ කුමන හැගීමකින්ද?

2024 අවුරුද්දේ ජූනි මාසයේදී ලොස් ඇන්ජලීස් හීදී නායකත්ව පුහුණු වැඩමුලුවක් පැවැත්වුණු අතර එහිදී සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර සම්මන්ත්‍රණයකදී කලින් හමු වූ මිතුරන් පිරිසක් නැවත හමු වූවා. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර සම්මන්ත්‍රණයට සහභාගී වූ 2018 අවුරුද්දේ මම මත්පැන් නිසා පීඩා විදිමින් කාංසාවෙන් සිටිනිසා කිසි විටෙකත් සතුටක් නොදැණුනු නිසාවෙන් කෝසෙයි කායි වෙතින් ඉවත් වීමටද සිතුවා. එතැන් සිට වසර 06 කට පසු නායකත්ව වැඩමුළුවේ සූත්‍ර සජ්ජායනයේ දෝෂි ලෙස කටයුතු කිරීමට අවස්ථාව හිමිවූ විට එය මට හැගුණේ, 2018 අවුරුද්ද ගැන අතීතාවර්ජනයක් ලෙසයි. ඒත් සමග, සද්ධර්ම



2024 අවුරුද්දේ ඔක්තෝබර් 27 වන දින දයිසේදෝවේදී ධර්මාචාර්ය ප්‍රදනෝත්සවයෙන් පසුව එයට සහභාගී වූ විදේශ සාමාජිකයින් සමග. (රිචඩ් මහතා අවසන් පෙලියේ වමේ සිට දෙවැනියා)



නායකත්ව පුහුණු වැඩමුළුවේදී දෝෂි ලෙස කටයුතු කරන රිචඩ් සාන්.

පුණ්ඩරීක සූත්‍රයේත්, ධර්ම මිතුරන්ගේත් ආශිර්වාදයෙන් මම වර්ධනය වූ බවත්, සතුටට පත් වූ බවත් වටහාගන්න හැකි වුනා. මත්පැන් නිසාවෙන් මට ඇති වූ දුක් වේදනාවන් වලට ස්තූති වන්නට, දුක් වේදනාවන් කෘතවේදීව භාරගන්නට ඉගෙනගත්තා. මෙතැන් සිට ඉදිරියටත්, නොපැමිණි අනාගතය ගැන වද නොවී, මේ මොහොත වැදගත් කොට සලකමින් සෑම දිනක්ම කටයුතු කරන්න පොහොසත් හදවතකින් තෘප්තිමත්ව ජීවත් වන්න බලාපොරොත්තු වනවා.

2024 අවුරුද්දේ ඔක්තෝබර් මස ධර්මාචාර්ය ලබාගත් පසු, මේ වන විට ඒ පිළිබද ඔබගේ හදවතේ හැගීම මොන වගේද?

මගේ සිත ඉමහත් වූ ප්‍රීතියෙන්, ආඩම්බරයෙන් සහ නිහතමානීත්වයෙන් පිරී ඉතිරී යනවා. ධර්මාචාර්ය ලැබීම මට නව පුහුණුවකට ආරම්භයක් වන අතර, මෙතෙක් විදි දුක් වේදනාවන් වලින් මිදුණු බවක් සහ බුද්ධ ස්භාවය අවබෝධ වූවාසේ හැගෙනවා.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ඔබේ හදවතට තදින්ම දැණුනු කාරණය කුමක්ද?

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ හත්වන පරිච්චේදයේ 'ඉන්ද්‍රජාලිකව මවන ලද නගරයේ උපමාව' මගේ හදවත ගැඹුරේ තැම්පත්ව තිබෙනවා. බුද්ධත්වය සාක්ෂාත් කරගැනීමට යන දුෂ්කර ගමන් මාර්ගයේ වෙහෙසට පත්වූවුට නායකයෙකු ඔවුනට ගිමන් හැරීමට නවාතැනක් ඉන්ද්‍රජාලිකව මවා විවේක ගැනීමට අවස්ථාවක් ලබාදී ඔවුන්ව දිරිගන්වා අවසානය වෙත රැගෙන යන බව සදහන් වනවා. මෙම උපමාව මගේ ජීවිත කතාව හා සම්බන්ධ වන

බොහො අවස්ථාවන් තිබෙනවා. විවිධ උපායන් භාවිතා කරමින්, මාව ධෛර්යමත් කල මාව ධර්මයේ මාවතට යොමුකල ධර්ම ශාඛාවේ මේයා කියෝකයිචෝ සාන් ඇතුළු මාගේ ධර්ම මිතුරන්ට හදවතින්ම කෘතඥවනවා.

**රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ විශේෂිතම ගුණාංගය යැයි සිතන්නේ කුමක්ද?**

'සාමාජික අධිෂ්ඨනය' විශේෂිතයැයි මම සිතනවා. මන්ද යත්, 'සාමජික අධිෂ්ඨානය' තුල පුද්ගල පෞරුෂ වර්ධනය මෙන්ම, පවුලතුල, සමාජය තුල, ජාතීන් තුල සහ ලෝකයේ සාමය ස්ථාපිත කිරීම වෙනුවෙන් බෝධිසත්ව චර්යාව ප්‍රගුණ කලයුතු යැයි සහ අප සාමාජිකයින්ගේ පුහුණුවේ අරමුණ පැහැදිලිව ප්‍රකාශවන බැවිනි. ලෝක සාමය සාක්ෂාත් කරගැනීම සදහා රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය විසින් පවත්වන ලෝක සාමය සදහා ආගමික සහජීවනයද සුවිශෙෂී ස්ථානයක් ගනනවා.

**අවසාන වශයෙන් ඔබගේ ධර්ම පුහුණුවේ අනාගත අභිලාෂයන් සහ අරමුණු මොනවාද?**

මගේ ප්‍රධානම අරමුණ වන්නේ සියලුම මිනුසුන්ට දුකෙන් මුදවා ගැනිමට හැකි සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය හැකිතාක් පිරිසකට ඉගැන්වීමයි. අප සාමජිකයින් අතර බැදීම ශක්තිමත් කිරීමටත්, දුකින් මිදීමට වෙර දරන පුද්ගලයින්ව ධර්ම මිතුරන් ලෙස පිළිගත හැකි පරිදි ධර්ම ව්‍යාප්තියේ යෙදෙන්නත් අරමුණු කරනවා. මෙතැන් සිට පැවරෙන ඕනෑම කටයුත්තක් සතුටින් හා කෘතවේදීව භාරගෙන ඒවා තම වර්ධනයට ආශිර්වාදයක් කරගැනීමට අධිෂ්ඨාන කරනවා.




බිරිද වන කිනා සාන් සහ මිණිබිරිය සමග

## නිවානෝ සාම පදනම

එක් රටක, ආගම, දේශපාලනය සහ ආර්ථිකය මත පදනම්ව සාමකාමී සමාජයක් නිර්මාණය කල නොහැක. අධ්‍යාපනය, සංස්කෘතිය, විද්‍යාව යන විවිධ ක්ෂේත්‍ර වල සාමය වෙනුවෙන් කටයුතු කරන පුද්ගලයන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම මගින් සාමකාමී සමාජයක් ගොඩනැගිය හැකි වේ. නිවානෝ සාම පදනමද මෙම අදහසින් පිහිටුවන ලදි.

නිවානෝ සාම පදනම යනු විවිධ ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් සමාජයට ප්‍රයෝජනවත් වන සාම ක්‍රියාකාරකම් සිදුකරන, ආගම මත පදනම් වූ සංවිධානයකි.




මෙය 1978 අවුරුද්දේදී රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ 40 වන සංවත්සරය සමරන මොහොතේ සමරු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කරන ලදි.

මෙම පදනම විසින් සෑම වසරකම 'නිවානෝ සාම ත්‍යාගය' ප්‍රධානය කරනවා. ඒ සඳහා දේශිය සහ ජාත්‍යන්තර වශයෙන් ගැටුම් සහ ගැටළු විසදීමට විවිධ ආගම්වල පුද්ගලයින් සමග අත්වැල් බැදගෙන කටයුතු කරන පුද්ගලයින් සහ සංවිධාන ඉලක්ක කරනු ලබයි. එය එක් පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට ප්‍රදානය කරයි.

තවද, සාමය වෙනුවෙන් කටයුතු කරන සහ පර්යේෂණ පවත්වන කණ්ඩායම් සඳහා සහාය වීම, සම්මන්ත්‍රණ පැවැත්වීම සහ ලොව පුරා සිටින පුද්ගලයින් සමග විවිධ ක්ෂෙත්‍ර වල සංස්කෘතික ප්‍රවර්ධන ක්‍රියාකාරකම් කරන්නෙමු.





**ඇනුමට යමක්**

සෑම අවුරුද්දකම මැයි මාසයේදී සාම ත්‍යාග ප්‍රදනෝත්සවය පැවැත්වෙන අතර එයට සමගාමීව, සම්මානලාභීන් සහ සභාපති අතර සංවාදයක් පවත්වනු ලබයි. එහිදී ආගමික වෙනස්කම් හදුනාගෙන සාමය සාක්ෂාත් කර ගැනීමට එක්ව කටයුතු කිරීමේ වැදගත්කම ගැන සාකච්චා කරනු ලබයි.

※ කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.

## පාසල් අධ්‍යාපනය



රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය විසින්, අන් අය ගැන සිතන හදවතින් , මානව සම්පත් වර්ධනය කිරීමේ අරමුණින් කෝසෙයි ගකුඑන් නම් අධ්‍යාපන ආයතනය පිහිටුවන ලදි. මේ තුල, පෙර පාසලක්, ගැහැණු සහ පිරිමි ළමුන් සඳහා කනිෂ්ඨ පාසලක් සහ උසස් පාසලක් තිබෙනවා.

මීට අමතරව කාන්තා ජත්‍යන්තර තාක්ෂණ විද්‍යාලයේ දී බුදු දහමට අනුව එක් එක් පුද්ගලයාගේ පෞරුෂ වර්ධනය මෙන්ම, සමාජයට වැඩදායී පුද්ගලයෙකු බිහි කිරීම අරමුණු කරනවා.

## කෝසෙයි ගගකු කයි



ෂෝ. හිචිරිකි සහ රියුතෙකි නම් වූ ජපන් සංගීත භාණ්ඩ පිළිබඳ ඔබ අසා තිබෙනවාද? එම භාණ්ඩ අවුරුදු 1200 කටත් පෙර සිටම පැවතගෙන එන අතර එහි සංගීතය ගගකු ලෙස හඳුන්වයි. සාම්ප්‍රදායික ගගකු සංගීතය උගන්වනු ලබන්නේ කෝසෙයි ගගකු කයි විසිනි.

1950 අවුරුද්දේදී පිහිටුවන ලද කෝසෙයි ගගකු කණ්ඩායම, මූලස්ථානයේ පවත්වන උත්සව වලදී පමණක් නොව, විහාරස්ථාන වල සහ විවිධ ස්ථනවල අවශයතාවයන් අනුව සහයෝගය ලබාදෙනවා. ප්‍රංශයේ පැරිස් නුවර, අමෙරිකාවේ ලොස් ඇන්ජලීස් සහ කැනඩාවේන් වැන්කුවර් යන නගර වල මෙම සාම්ප්‍රදායික සංගීත කලාව හඳුන්වා දී තිබෙනවා.

※私的使用を除き、無断で複製・転載をしないでください。

## අකමැති පුද්ගලයන්ටද ආදරය කරමු

# කැමැත්ත හා අකැමැත්ත තම ආත්මාර්ථකාමීත්වයයි

නික්යෝ නිවානෝ තුමා
නිර්මාතෘ, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය




මෙම වසන්ත කාලයේ ආරම්භය වන අප්‍රේල් මස සිට නව රැකියා වලට සම්බන්ධ වන, ස්ථාන මාරු වන හා දැනටමත් රැකියාවට සම්බන්ධ වී මාස 3 ක් පමණ ගත වී තිබෙන පිරිස අතර ආයතන ප්‍රධානීයා හා අනෙකුත් සඟයන් සමඟ මානුෂීය සබඳතා වල කැමැති හා අකැමැති බව ඇතිවෙන්නට පටන් ගන්නවා. කෙනෙකුට කැමැත්ත ඇතිවීම හොදය, අකමැති පුද්ගලයන් වැඩිවන්නේ නම් එය ගැටළුවකි. එසේම තම ආතතියටද හේතුවේ. 'මේ පුද්ගලයාට මම අකැමැතියි', 'අර පුද්ගලයාට මම අකැමැතියි' ලෙසින් පත්වන විට, තමා දකින ලෝකයද කෙමෙක් කෙමෙන් පටු වේ. එබැවින්, පුද්ගලයන්ව අකැමැති නොවී සිටීම හා අකැමැති පුද්ගලයන්ට කැමති අය බවට පත්කර ගැනීමට විවිධාකාර උපක්‍රම අවශ්‍ය වේ.

කැමැත්ත හෝ අකැමැත්ත ඇතිවීම චිත්තාවේගයේ ගැටළුවක් වන බැවින්, එය ආපසු හැරවීම ඉතා අසීරු කරුණක් වුවද, කළ නොහැකි දෙයක් නොවෙයි. මන්දයත් මනුෂ්‍යයගේ හදවත නිතරම වෙනස්වන සුළු නිසාය. හොඳින් සිතා බලන්න, යකඩ රත්තරන් බවට පත්කළ නොහැකිවේ, ලී වලට මොනදේ කලද ඇලුමිනියම් බවට පත්කළ නොහැකිවේ. ඒවා සමඟ සසදන කළ මනුෂ්‍ය හදවත නිතරම වෙනස් වේ.

එසේනම්, අකමැති පුද්ගලයන්ව, කැමතිම අය බවට පත්කර ගැනීමට කළ යුත්තේ මොනවාද. ඒ සදහා ක්‍රම 3ක් තිබෙනවා.

පලමු පියවර, තමා ගැන පසුවිපරම් කිරීම. මන්ද කැමැත්ත හා අකැමැත්ත තුල තම ආත්මාර්ථකාමීත්වය ගැබ් වී තිබෙන නිසා ඒ ගැන පසුවිපරම් කළ යුතුය. උදාහරණයක් ලෙසින්, අපට රළු වදන් පවසන අයට අකැමැති පුද්ගලයන් ගණයට දමයි. නමුත් එම රළු වචන අපගේ අඩුපාඩු හා දුර්වලතා පෙන්වාදෙනවා විය හැකිය. එහිදි මුලින්ම තමා සිතන ආකාරය වෙනස්කිරීමට උත්සහ කළ යුතුය. තමාගේ වෙනස්වීම තුලින් අන්‍යයන්ද වෙනස් වේ. එය ලක්ෂ සංඛ්‍යාත සාමාජික පිරිසක් සමඟ මම කටයුතු කිරීමෙන් ලද අත්දැකිම් නිසා ස්ථිරයෙන්ම එසේ වන බව පැවසිය හැකිවේ.

නික්යෝ නිවානෝ තුමා විසින් රචිත,
'යහපත් බවේ බීජයන් වපුරමු' ග්‍රන්ථයේ 74-75 පිටු ඇසුරිණි



# Director’s Column

## සිදුහත් කුමරු උපතේදී පැවසූ උදාන වැකියෙන් ඉගෙන ගත හැකි දෑ

කෙයිඉචි අකගාවා මහතා
රිෂ්ෂෝ කෝසෙයි කායි අන්තර්ජාතික මූලස්ථානය

සියළුදෙනාටම සුභ දවසක් වේවා. හදවත සතුටින් ඉපිලී යන වසන්ත කාලයයි මේ උදාවී තිබෙන්නේ. ගස් වැල් දළුලමින්, දීප්තිමත් පැහැයෙන් පරිසරය වෙනස්වන ආකාරය දකින විට, එහි ජීවයන්ගේ ක්‍රියාකාරීත්වය දැනෙනවා.

මේ මාසයේ ජපානයේ සිදුහත් කුමරුගේ උපත සැමරීම සිදු කරනවා. සිදුහත් කුමරු මේ ලෝකයට බිහිවීම කෙරෙහි කෘතවේදීත්වය, ගිහි බෞද්ධයෙකු ලෙස සිදුකිරීමට අවස්ථාවක් කරගැනීමට මම බලාපොරොත්තු වෙනවා. එසේනම්, සිදුහත් උපතේදී පැවසූ උදාර වාක්‍ය වන ‘මම මෙලොවට අග්‍ර වෙමි, ශ්‍රේෂ්ඨ වෙමි, මම ලොවට ජ්‍යේෂ්ඨ වෙමි’ යන්න තුලින් අප ඉගෙන ගත යුත්තේ කුමක්ද?

නිචිකෝ නිවානෝ තුමාගේ මේ මස මාසික පණිවුඩය තුලින්ද, මනුෂ්‍යයන් ලෙස ලැබූ ජීවිතයේ කෘතවේදීත්වය ධාරණය කරගෙන, බුදුන් වහන්සේ හා සමාන වටිනා ජීවයක් තමන්ටත් ලැබී තිබීම ගැන අපි එකිනෙකා භාරගැනීමේ වැදගත්කම කියාදී තිබෙනවා. නමුත් අපි සිතන්නේ බුදුන් වහන්සේ අපට වඩා ඉතා ඈතක සිටිනවා කියාය. අපගේ ජීවයද බුදුන් වහන්සේ හා සමාන ඉතාමත් දීප්තිමත් ජීවයක් වන බව තම හදවතට හොඳින් ග්‍රහණය කර ගැනීමද, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයේ සාමාජිකයෙකු ලෙස ඉතාමත් වැදගත් යැයි සිතමි. නිචිකෝ නිවානෝ තුමා නිතරම ‘තමාට ආදරය කරන්න, තමන්ට ගෞරව කරන්න’ ලෙස පවසන්නේද, තමා තුල තිබෙන බුද්ධ ශක්තියට දෑස් විවර කරගත යුතුයි යන ප්‍රාර්ථනය නිසාවෙන් බවයි මට දැනෙන්නේ.


එමනිසාම, මේ මස නිචිකෝ නිවානෝ තුමා දේශනා කරන පරිදිම, මෛත්‍රියෙන් හා දයානුකම්පාවෙන් අන්‍යයන් සමඟ කටයුතු කරමින්, අවශ්‍ය විටක තව කෙනෙකුගේ හිතට ශක්තියක් වන ආකාරයට තම ආධ්‍යාත්මය දියුණුකර ගනිමු.



ඇමෙරිකාවේ ශාඛා ප්‍රධානීන් හා සභාපතිවරුන්ගේ සමුළුව
ඇමෙරිකාවේ, ලෝස් ඇන්ජලීස් ශාඛාව, 2025 මාර්තු මස 15 වන දින
(ඉදිරිපෙළ දකුණේ සිට 3 වෙනියට සිටින්නේ අකගාවා මැතිතුමා)




# A Global Buddhist Movement




**Information about local Dharma centers**

**facebook**

**X**

We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp